**ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා (පුද්ගලික) සමාගම - 2017**

------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS for SME’s) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“මණ්ඩලය”) වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

පහත දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

(අ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි 17 පරිච්ඡේදයේ 17.19 වගන්තිය අනුව වත්කම් වල අපහරණ අගය, වත්කම් වල ඵලදායී ජීව කාලය හා ක්ෂය ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කර ගැලපුම් කළ යුතු වුවද සමාගමේ, පිරිවැය රු.7,128,398 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ වැය කරන ලද එකතු වටිනාකම රු.8,203,085 ක් වූ වියදම් වෙනුවෙන් ගෙවීම් වවුචර් සහ උපකාරක ලියවිලි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි 2 පරිච්ඡේදයේ 2.36 වගන්තිය අනුව සෑම ආයතනයක්ම උපචිත පදනම අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල යුතුය. එහෙත් ඊට පටහැනි ලෙස සමාගම විසින් බදු කුලී ආදායම සඳහා (ගාලු මුවදොර පිටිය) උපචිත පදනම යොදා ගැනීම වෙනුවට මුදල් පදනම අනුගමනය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල සමාලෝචිත වර්ෂයේ බදු කුලී ආදායම රු. 3,041,330 කින් ඌන ගණනය වී තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම සහ විගණනයේ විෂය පථය සහ සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු වල බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් ප්‍රමාණවත් ලෙස ලබාගෙන ඇති අතර මාගේ පරීක්ෂණ වලින් පෙනීයන අන්දමට, සමාගම විසින් විධිමත් ලෙස ගිණුම් වාර්තා හා පොත්පත් පවත්වාගෙන ගොස් ඇති බවත්, සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 පැහැදිලි නොකළ වෙනස්කම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව තොග ශේෂය රු. 960,017 ක් වූ අතර එදිනට භෞතික සත්‍යාපන වාර්තා අනුව තොග ශේෂය රු. 238,376 ක් වුයෙන් මූල්‍ය ප්‍රකාශන හා තොග සත්‍යාපන වාර්තා අතර තොග ශේෂයේ රු. 721,641 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පරිගණකගත (Quick book Accounting package) මුදල් පොත අනුව බැංකු අයිරා ශේෂය රු. 5,680,645 ක් හා මුදල් පොත අනුව බැංකු අයිරා ශේෂය රු.7,714,245 ක් විය. කෙසේ වුවද පරිගණකයේ මුදල් පොතේ ශේෂය පදනම් කරගෙන බැංකු සැසඳුම් ප්‍රකාහනය පිළියෙල කර තිබීම හේතුවෙන් මුදල් පොතේ ශේෂය හා බැංකු සැසඳුම් ප්‍රකාශනය සකස් කිරීමට පදනම් කරගත් ශේෂ අතර රු. 2,033,600 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.2. විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------------

ලැබිය යුතු රඳවා ගැනීමේ බදු රු.1,701,936 ක් සම්බන්ධයෙන් බදු සහතිකපත් විගණනය සඳහා ඉදිරිපත් නොවූයෙන් අදාල ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය.

**2.3 ලැබිය හා ගෙවිය යුතු ගිණුම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොළඹ මහ නගර සභාව විසින් වරාය අධිකාරිය වෙත ගාලු මුවදොර පරිශ්‍රයේ වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු වශයෙන් රු.400,000 ක් බැගින් මාසික ගෙවීමට 2016 සැප්තැම්බර් 27 අංක එම්ජී/ටීඩීආර්එස්//2015 ලිපිය මඟින් එකග වී තිබුණි.ඒ අනුව 2016 වර්ෂයට අදාලව රු.2,000,000 ක් සහ සමාලෝචිත වර්ෂයට අදාල ගාස්තුව වූ රු.2,800,000 ක් සමාගම විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලැබිය යුතුව පවතින ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි.එහෙත් වරාය අධිකාරිය එම මුදල සමාගමට නැවත ගෙවීමට එකගවී නොමැති අතර සමාගමට එය අය කර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

(ආ) ගාලු මුවදොර පරිශ්‍රයේ ආදායම සහ වියදම එකම ලෙජර් ගිණුමක සටහන් කර තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ රු. 470,545 ක හර ශේෂයක් පැවතුණි කෙසේ වුවද සමාගම විසින් එය අය කර ගත යුතු පාර්ශවය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

**2.4 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

----------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) වරාය අධිකාරිය හා සමාගම 2016 සැප්තැම්බර් 15 දින එළඹ තිබූ ගාලු මුවදොර පිටියේ පරිපාලන නඩත්තුව හා කළමනාකරණය සඳහා වූ ගිවිසුමෙහි 9 වන වගන්තිය. | ගිවිසුම් කාලය තුල එක් එක් වර්ෂය අවසාන වී ඊළග වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර සමාගම විසින් වරාය අධිකාරිය වෙත වර්ෂයේ විගණනය කරන ලද මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2014 පෙබරවාරි 07 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 05 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් (Action Plan) පිළියෙල කර නොතිබුණි. |

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.

| | |
|---|---|
| (i) 4.2.2. වගන්තිය | අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් කාර්යසාධන වාර්තා කාලීනව සමාලෝචනය කර නොතිබුණි. |
| (ii) 7.4.1 වගන්තිය | විගණන කමිටුව රැස් වී අභ්‍යන්තර විගණනයෙන් සොයාගත් කරුණු මත පදනම්ව ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීමට අදාල නිර්දේශ ලබාදිය යුතු වුවත්, සමාගමේ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර විගණන කමිටු රැස්වීම් ද පවත්වා නොතිබුණි. |
| (iii) 7.4.2 වගන්තිය | ආයතනයේ පරිපාලන, මෙහෙයුම් හා අනෙකුත් ගැටළු සම්බන්ධව තීරණ ගැනීම හා ඒ පිළිබඳ පසුවිපරම් ක්‍රියාත්මක කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටු කාලානුරූපීව රැස්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී ඉහත කමිටු රැස්වී නොතිබුණි. |
| (iv) 7.4.5 වගන්තිය | ආයතනය සතු ස්ථාවර වත්කම් හා තොග සත්‍යාපනය කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්‍ෂණ මණ්ඩල පත්කර වාර්ෂිකව භාණ්ඩ සමීක්‍ෂණයක් සිදු කළ යුතු වුවද ආයතනය සතු පිරිවැය රු.7,128,398 ක් වූ ස්ථාවර වත්කම් හා රු. 960,017 ක තොග, සමාලෝචිත වර්ෂය අවසානයේදී සත්‍යාපනය කර නොතිබුණි. |
| (v) 9.3.1 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම සෑම තනතුරක් සඳහාම විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් (Schemes of Recruitment) පිළියෙල කර ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගත යුතු වුවත්, සමාගම විසින් එවැනි බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අදාල පාර්ශවයන්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

(ඈ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී1/2015 චක්‍රලේඛය සහ අංක පීඊඩී1/2015 (1) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 3 හා 3.3 වගන්ති

(i) චක්‍රලේඛ සීමාවන්ට පටහැනිව 2017 වර්ෂයේ මාස 06 ක් සඳහා නිලධාරීන් දෙදෙනෙකුට එකතුව රු. 300,000 ක්වූ ඉන්ධන දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

(ii) ප්‍රවාහන දීමනාව ලබාදිය හැක්කේ එච් එම් 1-1 ශ්‍රේණියේ හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි නිලධාරියෙකුට වුවත් ඊට පටහැනිව නිශ්චිතව හඳුනා නොගත් අනුමත නොවූ කළමනාකරණ තනතුරක් දරණ නිලධාරියකුට 2017 වර්ෂයේ දී රු.240,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි.

| | | |
|---|---|---|
| (ඉ) | සමාගමේ සුළු මුදල් ගෙවීම් පාලනය සඳහා හඳුන්වා දී ඇති මූල්‍ය කාර්යපටිපාටියේ 2.4.2 (බී) වගන්තිය. | සුළු මුදල් ගෙවීම් වවුචර් මගින්, සුළු මුදල් ගෙවීම සිදු කළ යුතු වුවද 2017 වර්ෂයේ සිදු කර තිබූ සුළු මුදල් ගෙවීම් සඳහා වවුචර් භාවිතා කර නොතිබුණි. මේ හේතුවෙන් එම ගෙවීම් සඳහා අනුමැතිය, නිවැරදිභාවය විගණනයේදී තහවුරු නොවුනි. |

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,049,281 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. 12,062,371 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,013,090 කින් හෙවත් සියයට 8 ක අඩු වීමක් නිරීක්ෂණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**4.1 කාර්යසාධනය**

----------------

**අරමුණු**

----------

ශ්‍රී ලංකා වරාය පරිශ්‍රයෙන් පිටත පිහිටි වරායට අයත් මුහුදු සීමාවට පැමිණෙන නැව් ස්ථානගත කිරීමේ පහසුකම් සැපයීම, නැව් බඩු පැටවීම් ගොඩබෑම් ආශ්‍රිත පරිවාස සේවා සැපයීම, උපකරණ සැපයීම අදාල අවස්ථාවලදී වරාය රථවාහන තදබදය පාලනය විධිමත් කිරීම මෙන්ම වාජ්පු කටයුතු , ගුදම් කටයුතු ඉටුකිරීම, එම කටයුතු සඳහා ගාස්තු අයකිරීම හා ඒවා පිළිබඳ වාර්තා පවත්වා ගැනීමට අදාල සියලු කටයුතු සම්බන්ධ මෙහෙයුම් හා පරිපාලන කටයුතු භාරගැනීම අධීක්ෂණය හා පාලනය ශ්‍රී ලංකා වරාය කළමණාකරන හා උපදේශන සමාගමේ ප්‍රධාන අරමුණු වේ.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2018 අප්‍රේල් 10 වන සමාගම විසින් 2017 වර්ෂයේ බදු පෙර ලාභ ලෙස හඳුනාගෙන තිබූ රු. 18,516,768 ක් පදනම් කර ගෙන එක් නිලධාරියෙකුට රු. 74,042 ක බැගින් රු. 956,436 ක් වූ ප්‍රසාද දීමනා අත්තිකාරමක් ගෙවා තිබුණි. එහෙත්, 2018 ඔක්තෝබර් 16 දින සමාගම විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව, බදු පෙර ලාභය රු. 10,297,402 ක් වූයෙන් ප්‍රසාද දීමනා ගණනය කිරීමේ නිවැරදිතාවය සම්බන්ධයෙන් විගණනයේදී ගැටළු සහගත විය.

(ආ) 2015 වර්ෂයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් අයවිය යුතු රු. 5,901,323 ක ගොඩනැගිලි නවීකරණ වියදම සහ රු.1,013,472 ක වන්දි මුදල් ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබූ අතර 2018 ජූලි 04 දිනැති අංක එස්එල්පීඑම්සී/21/2018 දරණ පාලක මණ්ඩල තීරණය අනුව ඉහත මුදල් සඳහා සියයට 100 ක අඩමාන ණය ප්‍රතිපාදනයක් සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

(ඇ) සමාගමට එරෙහිව පවරා තිබූ නඩු 2 ක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

**4.3** **කාර්ය මණ්ඩල පරිපාලනය**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2011 ට අනුව සුවිශේෂී තත්ත්වයන් යටතේ මාස 06 කට නොවැඩි කාල සීමාවකට හැර වයස අවුරුදු 60 ඉක්ම වූ විශ්‍රාමික රජයේ නිලධාරීන් තවදුරටත් සේවයේ යොදවාගත නොහැකි වේ.එහෙත් 2018 ජූලි 30 දිනට වරාය අධිකාරියෙහි සේවය කර විශ්‍රාමලත් නිලධාරීන් 09 දෙනෙකු වරාය කළමනාකරණ හා උපදේශන සමාගම හරහා වරාය අධිකාරියේ සේවයට නැවත බඳවාගෙන තිබුණි. මෙයින් නිලධාරීන් 8 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත වර්ෂයක කාලසීමාවක් සඳහා මුලින් බඳවාගෙන තිබූ අතර පසුව වර්ෂ 1 සිට වර්ෂ 11 දක්වා කාල පරාසයක් සඳහා සේවය දීර්ඝ කර තිබූ බව නිරීක්ෂණය විය. මෙසේ 2017 වර්ෂය තුළ සේවයේ යෙදී සිටි නිලධාරීන් 7 දෙනෙකු සඳහා සමාගම හරහා වැටුප් හා දීමනා ලෙස වර්ෂය තුළදී රු. 4,664,168 ක් ගෙවා තිබුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය පූකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ වුවත්, සමාගමේ 2017 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ 2018 ඔක්තෝබර් 16 දිනදීය.

**5.2** **අයවැය පාලනය**

අයවැය ලේඛනයක් සකස් කර කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගත යුතු වුවද, සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මට හා ක්‍රියාකාරී සැලැස්මට අනුගතව අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මානව සම්පත් කළමනාකරණය | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර නොගැනීම. |
| (ආ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන අංශයක් නොපිහිටුවීම සහ විගණන වැඩසටහනක් අනුව අභ්‍යන්තර විගණනයක් සිදු නොවීම. |
| (ඇ) | තොග පාලනය | තොග වාර්තා පවත්වා ගැනීම අක්‍රමවත් වීම. |
| (ඈ) | ලැබිය යුතු ශේෂ | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම. |